WORKED.


# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,603—1958 නොවැම්බර් 28 වැනි සිකුරාදා—28.11.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඝ කරන ලදි)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොද ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | | පිට |
|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාගෙන් කරන ප්‍රකාශන | ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාගෙන් කරන පත් කිරීම් | ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | | 3529 |
| වෙනත් පත් කිරීම් ... | — | 3530 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... | ... | 3530 |
| ආණ්ඩුවේ නිවේදන ... | ... | 3530 |
| මිළ පාලන දැන්වීම් .... | .... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... | ... | 3533 |
| "සුරාබද්ද ආඥාපණත" පිළිබඳ දැන්වීම් | — | — |


## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1958 අංක 516**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේය :—

අංකය : ජේජ්. 21/48.

ජ්. ඊ. ආර්. කොරෙයා මහතා, ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1959 ජනවාරි 9 වැනි දින, නාවලපිටියේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 5,762 නඩුව ඇහීමට, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට.

අංකය : ජේඑම්. 2/56.

එම්. පී. සී. රත්නම් මහතා, 1958 නොවැම්බර් 9 වැනි දින පටන්, නැවත නියමයක් කරන තුරු, හලාවත අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හා හලාවත අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට, පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හා පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑල්. 2/48.

එෆ්. ඊ. ඇලස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එන්. කුමාරසාමි මහතා, 1958 නොවැම්බර් 19 වැනි දින පටන්, මහනුවර අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, මහනුවර අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධූරයට, මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට, දුම්බර අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට.

අංකය : ජේඑල්. 70ඒ/51.

සී. බී. වල්ගම්පාය මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, පී. එන්. බතෝලමියුස් මහතා, 1958 නොවැම්බර් 15 වැනි හා 16 වැනි දිනයන්හි, නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට, නුවරඑළියේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, නුවරඑළියේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධූරයට, හා බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට.

අංකය : ජේඑල්. 1/48.

ඩබ්ලිව්. ඊ. අබේකෝන් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. ඒ. එල්. කොරෙයා මහතා, 1958 නොවැම්බර් 21 වැනි දින, හලාවත හා පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට, හලාවත අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හා පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට.

අංකය : ජේඑල්. 57ඒ/58.

ඩබ්ලිව්. ඩී. තාමෝදරම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. ඒ. සී. සිරිසේන මහතා, 1958 නොවැම්බර් 15 වැනි දින පටන් 17 වැනි දින දක්වා, බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හා බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑල්. 34ඒ/48.

එස්. එස්. කුලතිලක මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ජී. එස්. සඳරත්න මහතා, 1958 නොවැම්බර් 18 වැනි දින, කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හා කුරුණෑගල, කනදුල්ල උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේජ්. 40/48.

බී. ආර්. ජී. විජේයකෝන් මහතා, 1958 නොවැම්බර් 22 හා 23 වැනි දිනයන්හි, මාතලේ දිස්ත්‍රික් උසාවියේ අංක එම්ආර්. 1,260 නඩුව ඇහීමට, මහනුවර මාතලේ උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑල්. 42සී/54.

ජී. සී. නයිල්ස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ඉලෙයතම්බි මහතා, 1958 දෙසැම්බර් 2 වැනි දින, යාපනේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හා යාපනේ මල්ලකම් උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑල්. 49/48.

එස්. එන්. රාජදූරේ මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, වී. කනගසබේ මහතා, 1958 නොවැම්බර් 19 වැනි දින, පේදුරු තුඩුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හා පේදුරු තුඩුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජෙඑල්. 37ඒ/55.

පී. මාරපන මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, බී. ආර්. ජී. විජෙයකෝන් මහතා, 1958 නොවැම්බර් 21 වැනි දින, මාතලේ අතිරේකූ මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොම සාරිස් ධුරයට හා මහනුවර, මාතලේ උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පීඑල්/පී. 1/48.

ආර්. පරමකුරු මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු' එෆ්. එස්. පෝල් මහතා, 1958 නොවැම්බර් 17 වැනි හා 18 වැනි දිනයන්හි, මන්නාරම් දිස්ත්‍රික්කයේ මන්නාරම් ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/අයි. 4/52.

ජේ. ඊ. ඉලංගන්තිලක මහතා නැති අතර, එස්.එච්. අබ්දුල් කාදර් මහතා, 1958 නොවැම්බර් 22 වැනි දින, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැළඩිවිලි හත්පත්තුවේ හා හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ආර්. 2/48.

සී. ඒ. රත්නායක මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එම්. ඒ. ඊ. බී. පෙරේරා මහතා, 1958 නොවැම්බර් 22 වැනි හා 24 වැනි දිනයන්හි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට, හා වන්නි හත්පත්තුවේ, කටුගම්පොල හත්පත්තුවේ හා හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවියේ අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීජ්ජ්/38/57.

එල්. සේනානායක මහතා, 1958 නොවැම්බර් 18 වැනි දින, දන්ඩගමුවේ ගම්බද උසාවියේ අංක. සී. ආර්. එම්. 1,657 හා 1,725 නඩු ඇහීමට, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල හත්පත්තුවේ හා දඹදෙනි හත්පත්තුවේ ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයට.

අංකය : පීඑල්/ඩබ්ලිව්. 9/53.

පී. ඩී. පී. විජේසේකර මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. එච්. බී. පීරිස් මහතා, 1958 නොවැම්බර් 24 වැනි හා 26 වැනි දිනයන්හි, ගාලු දිස්ත්‍රික්කයේ ගහබඩ හා හිණිදුම් පත්තු ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට, හා වැල්ලබඩ පත්තුවේ ගම්බද උසාවියේ අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

එස්. ආර්. විජෙයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1958 නොවැම්බර් 22 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය 573,
කොළඹ 12.

# වෙනත් පත් කිරීම්

**1958 අංක 517**

අංකය : ඒ. ඕ./1958.

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 1947 සැප්තැම්බර් මස 18 වෙනි දින අග්‍රාණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ නිවේදනයකින් සංශෝධනය කරන ලද 372 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින් එම සිවිල් නඩු විධාන සංග්‍රහයේ 371 වෙනි වගන්තියේ සඳහන් දිව්රුම් සහතික කිරීම පිණිස, 1958 නොවැම්බර් මස 24 වෙනි දින සිට, අයිවන් ප්‍රනාන්දු මහතා හැටන් පිස්කල් මාර්ෂල් තැන වශයෙන් වැඩබලන කාලය තුල හැටන් අධිකරණ කොට්ඨාශයට විශෙෂ නිලධාරියෙක් වශයෙන් පත්කර ඇත්තේය.

---

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 16 වෙනි පරිච්ඡෙදයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

1958 ඔක්තෝබර් මස 5 වෙනිදු සිට, එච්. පී. ගුණවර්ධන මහතා නැවත වැඩ භාරගන්නා තුරු, කළුතර දිස්ත්‍රික්කයේ හොරණ කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඩී. එන්. වන්නිආරච්චි මහතා ද,

1958 නොවැම්බර් මස 18 වෙනිදු සිට, එස්. එම්. තියෝෆිලස් මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මඩකලපු දිස්ත්‍රික්කයේ උතුරු මන්මුනෙයි කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි ධුරය දරණ කාලය තුළ එම කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට කේ. සෝමසුන්දරම් මහතා ද,

1958 නොවැම්බර් මස 22 වෙනි දින සිට, එල්. පී. ඊ. කරුණාරත්න මහතා නැවත වැඩ භාරගන්නා තුරු, කොළඹ දිස්ත්‍රික්කයේ මීගමු නගර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ක්‍රිස්ටි ද කෲස් මහතා ද,

1958 දෙසැම්බර් මස 1 වෙනි දින සිට, විල්මට් තල්දෙන මහතා නැවත වැඩ භාරගන්නා තුරු, බදුල්ල දිස්ත්‍රික්කයේ ඔයපළාත කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ටී. බී. තල්දෙන මහතා ද, පත් කර ඇත්තේය.

ජී. සී. ටී. ඒ. ද සිල්වා.
අධිකරණ අමාත්‍යංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1958 නොවැම්බර් මස 24 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යංශයේදීය.

**1958 අංක 518**

ධනපාල සිරිසේන වීරසිංහ මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙස්කු වශයෙන් ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ ස්ථිර ලේකම්.

1958 නොවැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

---

**1958 අංක 519**

සෝමනාත පිල්ලෙයි රාජනාතන් මහතා ත්‍රිකුණාමලය අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ ස්ථිර ලේකම්.

1958 නොවැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

# රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය

**1958 අංක 520**

වර්ෂ 1958 නොවැම්බර් මස 17 වැනි දින සිට පහත සඳහන් පත්කිරීම් මවිසින් නියමකර ඇත :—

(1) "විධායක ලිපිකාර සේවයේ දෙවන ශ්‍රෙණියේ ලිපිකරු හේමචන්ද්‍ර කොඩිකාර මහතා පානදුරේ ඉඩම් ලියාපදිංචි කිරීමේ ශාඛා කාර්යාලය යෙහි සේවය කරමින් කළුතර පාලන දිස්ත්‍රික්කයේ අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් වශයෙන්".

(2) "විධායක ලිපිකාර සේවයේ දෙවන ශ්‍රෙණියේ ලිපිකරු හපුආරච්චිගේ නිමලදස මහතා රත්නපුර පාලන දිස්ත්‍රික්කයේ අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් වශයෙන්."

ඩී. ජී. ඇල්. මිසෝ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

1958 නොවැම්බර් මස 17 වැනි දින,
කොළඹ 1, රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේදීය.

# ආණ්ඩුවේ නිවේදන

**1941 අංක 27 දරන කම්කරු පඩි සභා ආඥාපනත**

**නිවේදනයයි**

වර්ෂ 1943 අංක 40 දරන ආඥාපනතින් සංශොධිත වර්ෂ 1941 අංක 27 දරන කම්කරු පඩි සභා ආඥාපනතේ 28 වන වගන්තිය යටතේ ඉංජිනේරු කර්මාන්තය පිළිබඳ කම්කරු පඩි සභාව විසින් ඇති කරන ලදුව මීට යාව ඇති උපලෙඛනයෙහි දක්වා ඇත්තා වූ තීරණයන් ගරු කම්කරු, නිවාස හා සමාජසේවා ඇමති තුමන් විසින් අනුමත කරන ලද බව එකී කම්කරු පඩි සභා ආඥාපනතේ 27 (3) වන වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙ තීරණයෝ වර්ෂ 1958 දෙසැම්බර් මස 1 වන දින වලංගු බවට පැමිණෙති.

ජේ. ඇල්. ඊ. ප්‍රනාන්දු,
ස්ථිර ලේකම්වරයා වෙනුවට,
කම්කරු, නිවාස හා සමාජසේවා අමාත්‍යංශය.

1958 නොවැම්බර් මස 21 වන දින,
කොළඹ දී ය.

**උපලෙඛනය**

ඉංජිනේරු කර්මාන්තය පිළිබඳ කම්කරු පඩි සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1945 අගෝස්තු මස 10 වන දින අංක 9,447 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයේ උපලෙඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද වර්ෂ 1946 පෙබරවාරි මස 22 වන දින අංක 9,523 සහ වර්ෂ 1948 පෙබරවාරි මස 27 වන දින අංක 9,837 දරන ගැසට් පත්‍රවලද වර්ෂ 1951 මාර්තු මස 30 වන දින අංක 10,229, වර්ෂ 1953 ජූනි මස 29 වන දින අංක 10,542 සහ

වර්ෂ 1955 ජූනි මස 30 වන දින අංක 10,811 දරන විශෙෂ ගැසට් පත්‍රවල ද වර්ෂ 1957 දෙසැම්බර මස 27 වන දින අංක 11,224 සහ වර්ෂ 1958 පෙබරවාරි මස 28 වන දින අංක 11,268 දරණ ගැසට් පත්‍රවල සහ වර්ෂ 1958 අගෝස්තු මස 30 වන දින අංක 11,509 දරන විශෙෂ ගැසට් පත්‍රයේ ද පළ කරන ලද නිවේදනයන්හි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කරන ලද්දාවූ ද තීරණ එම උපලෙබනයේ II වන කොටසේ ''වැඩ කාරයින්ගේ පන්තිය'' යන ශීර්ෂය යටතේ මෙහි පහත දක්වෙන පරිද්දෙන් තව දුරටත් වෙනස් වේ :—

(අ) ''අර්ධ වශයෙන් පුහුණු (අඩ පුහුණු) කම්කරුවෝ—I වර්ගය'' යන උප ශීර්ෂය යටතේ ඇති ''දෙඹකර ක්‍රියා කරවන්නෝ'' යන කරුණ ඉවත් කිරීමෙන් සහ;

(ආ) ''පුහුණු වූ (දක්ෂ) කම්කරුවෝ'' යන උප ශීර්ෂය යටතේ ඇති ''රිවැටර්වරු සහ කෝකර්වරු'' යන කරුණු අස්කොට ඒ වෙනුවට ''රිවැටර්වරු සහ කෝකර්වරු; දෙඹකර ක්‍රියා කරවන්නෝ'' යන කරුණු යෙදිමෙන් ද වේ.

---

**ලංකාවේ ලියාපදිංචි කරන ලද නැව් සමාගම් සවකීය කටයුතු කර තිබෙන පිළිවෙල සෝදිසි කර බලා එම නැව් සමාගම් කෙසේ දියුණුකරලිය යුතුදැයි යෝජනා කිරීම සඳහා අග්‍රාණ්ඩුකාර තුමා විසින් පත් කරන ලද කොමිසමයි**

පහත සඳහන් කරුණු සම්බන්ධව යථෝක්ත කොමිසම අග්‍රාණ්ඩුකාර තුමා විසින් පත් කරන ලදී :—

(1) විශෙෂයෙන් පහත සඳහන් කරුණුවලට සැලකිල්ලක් දක්වමින් ලංකාවේ ලියා පදිංචි කරන ලද නැව් සමාගම්වල වැඩ පිළිවෙල සම්බන්ධව සෝදිසි කර බැලීම :—

(අ) පරිපාලනය, මිල මුදල් යෙදවීම, බඩු ගෙනයාම සහ නැව් යෙදවීම නියම කිරීම, රක්ෂිත මුදල වැඩි කර ගැනීම සහ නැව් අත්පත් කර ගැනීම සංඛ්‍යාත නාවික කටයුතු මෙහෙය වීමෙහි කායර්‍යක්ෂමතාව.

(ආ) කොටස්කරුවන්ට ගෙවිය යුතු කොටස් ගෙවීම.

(ඇ) ලංකාණ්ඩුව වෙත ඉටුකළ යුතු යුතුකම් ඉටු කිරීම සහ

(2) පහත සඳහන් කරුණු පිළිබඳ විශෙෂ සැලකිල්ලක් ඇතිව ලංකා නැව් සමාගම් සංවර්ධනය කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම:—

(අ) විදේශීය විශේෂඥයින් ලබා ගැනීම සහ ලාංකිකයන් පුහුණු කිරීම සංඛ්‍යාත නාවික ව්‍යාපාරික කටයුතු පරිපාලනය.

(ආ) මිල මුදල් යෙදීම.

(ඇ) නැව් ලබා ගැනීම.

(ඈ) නැව් යෙදවීම.

(ඉ) ලංකා නාවික කටයුතු සංවර්ධන කිරීමෙහි ලා ආණ්ඩුවේ සහ පෞද්ගලික ආයතන මගින් කළ හැකි වැඩ කොටස.

(ඊ) දැනට ලියා පදිංචි කර තිබෙන නැව් සමාගම් මගින් එවැනි සංවර්ධන කටයුතු සඳහා කළහැකි වැඩ කොටස.

(උ) ගෙවිය යුතු ගණන් හිලව් සාධාරණ ඒවා බව සහතික කෙරෙන අතරම ලංකා නාවික කටයුතු සංවර්ධන කිරීමෙහි ලා ආණ්ඩුවේ බඩු බාහිරාදිය නැව් මාර්ගයෙන් ගෙනයාමේ ඉතාම හොඳ වැඩපිළිවෙල ඇතිකරලීම. සහ

(ඌ) එවැනි සංවර්ධන කටයුතු සඳහා ආණ්ඩුව අනුගමනය කරන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස ඇති කළ යුතු අවශ්‍ය ආණ්ඩුවේ වැඩ පිළිවෙළ.

මේ සඳහා මහජනයාගෙන් කරුණු දැක්වීම අපේක්ෂා කළ නමුදු මෙහි කාර්ය මාලාවෙහි දෙවැනි කොටස සම්බන්ධව ලැබුණු උනන්දුව ඉතා ස්වල්පය. එබැවින් එහි කාර්ය මාලාවෙහි දෙවැනි කොටස පිළිබඳ තමන් ඉදිරිපත් කරන්නට කැමති කිසියම් තොරතුරක් ඇත්නම් 1958 දෙසැම්බර් 10 වැනි දින හෝ ඊට ප්‍රථම මෙම කොමිසම වෙත ඒවා ඉදිරිපත් කරන්නට යයි මහජනයාවෙත නැවතත් මෙයින් ආයාචනය කර සිටිනු ලැබේ.

එම කරුණු ඉදිරිපත් කිරීමේදී ඒවා කඩදාසියෙහි එක පැත්තක පමණක් ටයිප් ගසා (පිටපත් අටකින් යුක්තව) පහත අත්සන් කරන ලද නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු වේ.

එසේ කරුණු ඉදිරිපත් කරනු ලබන අයට ඔවුන්ගේ සාක්ෂි සටහන් කර ගැනීම සඳහා කොමිසම ඉදිරිපිටට පැමිණෙන්නට යයි පසුව දැන්වීමට කොමිසමට බලය තිබේ.

කොමිසමේ අණ පරිදි,

සී. එච්. ජේ. අමරතුංග,
ලේකම්.

1958 නොවැම්බර් 19 වැනි දින,
ලංකා නාවික පරීක්ෂක කොමිසමේ කාර්යාලය,
53 වෙනි කාමරය, ගෝල්පේස් කෝට් අංක 2,
කොළඹ 3.

---

## 4 බී පෝර්මය

### 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පනත

**පනතේ දහවැනි වගන්තිය යටතේ දැන්වීමයි**

ඉන්දියානු සහ පකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ වැඩබලන කොමසාරිස් තැන්පත් වික්ටර් ජෝශප් හැරල්ඩ් ගුණසේකර වන මා, 1949 නො. දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පණතේ දහවැනි වගන්තිය යටතේ දැනුම් දී සිටින්නේ පහත සඳහන් උපලෙබනයේ දක්වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම එකී පණතේ 4 වැනි වගන්තියේ 1 වැනි සහ 2 වැනි උප වගන්ති යටතේ අනුමතකිරීමට යම්කිසි මහජනයෙකුගේ විරුද්ධතාවයක් ඇත්නම් කුමන කාරණ නිසා එවැනි විරුද්ධතාවය මුල්කරගනු ලැබීද යනු සඳහන් ලිපියක් මෙම දැන්වීම ප්‍රසිද්ධකළ දින සිට මසක් තුළදී නොලැබුනි නම් ඒ සෑම ඉල්ලුම් පත්‍රයක්ම අනුමතකරන බවයි.

විරුද්ධවන සෑම අයෙකුගේම සම්පූර්ණ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල සෑම විරුද්ධවීමේ නිවේදනයකම ඇතුළත්විය යුතුයි.

වී. ජේ. එච්. ගුණසේකර,
ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ
වැඩ බලන කොමසාරිස්තැන.

කොළඹ, 1958වූ නොවැම්බර් මස 24 වෙනි දින දීය.

### උපලෙබනය

| ඉල්ලුම්පත්‍රයෙහි නො. සහ දිනය | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචිකිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචිකිරීමට අල්ලුම්කරන අයගේ නමත් සමග ලියාපදිංචිකිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|
| J. 824—28.2.51 | ... නාරායනන් මුනිසාමි, සාන්ත ඇන්ඩෘගේ කොටස, ලක්ෂපාන වතුයාය, මස්කෙලිය | පච්චයම්මා (භාර්‍යාව), ගෝපාලක්‍රිෂ්ණන් (පුතා), ගෝවින්දරාජ් (පුතා), පාර්වතී නොහොත් කුප්පම්මා (දුව), ක්‍රිෂ්ණන් (පුතා), නාරායනන් නොහොත් නාරායනසාමි (පුතා), මුතුලෙච්චුමී (දුව), බාලක්‍රිෂ්ණන් (පුතා) |
| J. 1451—21.6.51 | ... සෙබස්තියන් සවරි, මෝකා වත්ත, මස්කෙලිය ... | සවරිඅම්මා (භාර්‍යාව), ජෙබමාලෙයි (පුතා), අන්තෝනිඅම්මා නොහොත් අන්තෝනි මේරි (දුව), යේසුපාලන් (පුතා), මේරි පිලෝමිනා (දුව) |
| J. 2672—25.3.51 | ... සින්නකරුප්පන් කන්දසාමි, බ්‍රවුන්ලෝ වත්ත, මස්කෙලිය | මුරුගායි (භාර්‍යාව), පිච්චෙයි (පුතා), සුබ්‍රමානියම් (පුතා) |
| J. 2837—17.1.51 | ... ගොවින්දන් වේලයුදම්, මෝකා වත්ත, මස්කෙළිය ... | කන්නියම්මාල් (භාර්‍යාව), පරමසිවන් (පුතා), අමරාපතී නොහොත් අන්ජනා (දුව), වනතායි (දුව), තුලුකාන (දුව) |
| J. 3641—8.7.51 | ... වේලායුදම් පෙරියසාමි, ස්ටොක්හෝම් වත්ත, අප්කොට් | කරුප්පායි (භාර්‍යාව), සුප්පයිය (පුතා), කාමච්චි (දුව). මුතුසාමි (පුතා), පෙරිඅන්නන් (පුතා), තයියනායකී (දුව) |

| ඉල්ලුම්පත්‍රයෙහි නො. සහ දිනය | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචිකිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචිකිරීමට ඉල්ලුම්කරන අයගේ නමත් සමග ලියාපදිංචිකිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|
| J. 3764—13.7.51 | ... ජෙයමනී ඥණමුතු තොමස්, ලක්ෂපාන වත්ත, මස්කෙළිය | ජෙයබායි පාක්කියම් (භාය්‍යාව), හැරී සෙල්වමනී (පුතා), කිංස්ලි විල්ප්‍රඩ් ඥණරාජ් (පුතා), ලෙස්ලි සර්ගුනම් (පුතා), ඩැනියල් චන්ද්‍රන් ස්ටැන්ලි (පුතා), ප්‍රෙඩරික් සැමුවල් (පුතා) |
| J. 5709—29.7.51 | ... කන්නි කරුම්බායිරම්, පෙයාලෝන් වත්ත, අප්කොට් ... | ලෙච්චුමී (භාය්‍යාව), පච්චමුත්තු (පුතා), වීරයියා (පුතා), මුක්කායි (දුව), සෙල්ලම්මා (දුව) |
| J. 6100—22.7.51 | ... තිරුමනි පලනියන්ඩි, මහනිලු කොටස, ස්ට්‍රැත්ස්පේ වතුයාය, අප්කොට් | පාර්වතී (භාය්‍යාව), වල්ලි අම්මා (දුව), පලනිඅම්මා (දුව) |
| J. 6206—22.7.51 | ... පක්කිරිසාමි විරපුතිරන්, මහනිලු කොටස, ස්ට්‍රැත්ස්පේ වතුයාය, අප්කොට් | සිවපාකියම් (භාය්‍යාව), සීරන්ගායි (දුව), සුබ්‍රමානියම් (පුතා) |
| J. 6413—8.7.51 | ... මානලමුත්තු ඉන්නාසි, මෝරේ කොටස, මෝරේ වතුයාය, මස්කෙළිය | පාකියම් (භාය්‍යාව) |
| J. 6582—28.7.51 | ... මරියපිල්ලෙයි එගම්බරම්පිල්ලෙයි, වටවැල්ල වත්ත, වටවල | පච්චෙයිඅම්මාල් (භාය්‍යාව), කනේසන් (පුතා), තනලෙච්චුමී (දුව) |
| J. 8108—25.7.51 | ... අරෝකියම් සන්තියාගෝ, සාන්ත ජෝන් ඩෙල් රේ වත්ත, නෝවුඩ් | සන්දනම් (භාය්‍යාව), අන්තෝනි (පුතා), සින්නප්පන් (පුතා), සන්දනම් (පුතා), ජෙබමාලේ මේරි (දුව), මදලයම්මාල් (දුව), අන්තෝනිමුත්තු නොහොත් මයිකල් (පුතා), පිලොමිනාල් (දුව) |
| J. 9547—30.7.51 | ... කොමාරසාමි පෙරුමාල්, ක්වීන්ස් ලන්ඩ් වත්ත, මස්කෙළිය | සින්නම්මාල් (භාය්‍යාව), රාසයියා නොහොත් දෙරරාජු (පුතා), රෙන්ගරාජු නොහොත් තාසන් (පුතා) |
| J. 11196—2.8.51 | ... ආරුමුගම් වීරප්පන්, පෝට්‍රිවත්ත, නෝවුඩ් ... | පන්ජවර්නම් (භාය්‍යාව) |
| J. 11283—22.7.51 | ... කාලිමුත්තු ගොවින්දසාමි, ගෙඩස් කොටස, මෝරේ වතුයාය, මස්කෙළිය | අභි ලන්දම් (භාය්‍යාව), සරෝජා (දුව) |
| J. 11366—22.7.51 | ... මාරිමුත්තු වීරමුත්තු, කෝප්පු කොටස, මෝරේ වතුයාය, මස්කෙළිය | පෙරියම්මා (දුව), අන්නමලෙයි (පුතා), තාන්දයි (දුව), රාසම්බාල් නොහොත් වල්ලිඅම්මා (දුව), පාසුමාතේවි (දුව) |
| K. 948—21.10.50 | ... පෙරුමාල් සිවානු, ඉහළ කොටස, කොටියගල වත්ත, බෝගවන්තලාව | තනලෙච්චුමී (භාය්‍යාව) |
| K. 2826—22.11.50 | ... මුනියන්ඩි මුතුරාක්කු, කිල්ලාර්නි වත්ත, බෝගවන්තලාව | අන්ගම්මා (භාය්‍යාව), ක්‍රිෂ්ණන් (පුතා), කරුප්පයිය නොහොත් පොන්නයියා (පුතා) |
| K. 3075—3.3.51 | ... මුතුලින්ගම් රාමසාමි, කොටගලකැලේ වත්ත, හැටන් | ලෙච්චුමී (භාය්‍යාව), වඩිවේළු (පුතා) |
| K. 5299—6.5.51 | ... කෙන්ගන් මුරුගන්, කාස්ට්ල්රීග් වත්ත, දික්ඔය ... | කෙන්ගම්මාල් (භාය්‍යාව), වේළු (පුතා), පොන්නම්මාල් නොහොත් පොන්නම්මා (දුව), මුරුගායි නොහොත් මුරුගම්මාල් (දුව), සිවානු (පුතා), කාමාඩ්චි (දුව) |
| K. 5364—22.7.51 | ... අවුරු මම්මු, නොම්මර 70, බන්ඩාරනායක නගරය, හැටන් | කතීජා බීබී (භාය්‍යාව), බෙපතුමා බීබී (දුව), සිත්ති පලීලා (දුව), අබ්දුල් කාදර් (පුතා), සිත්තීක් (පුතා), මයිමුන් (දුව) |
| K. 7954—2.7.51 | ... රාමසාමි නඩේසන්, ඔස්බෝන් වත්ත, හැටන් ... | සෙල්ලම්මා (භාය්‍යාව), රාජමානික්කම් (පුතා), ජයකුමාර් (පුතා) |
| K. 8713—22.7.51 | ... රත්නම් ප්‍රැන්සිස්, ප්‍රයිඩ්ලන්ඩ් වත්ත, බෝගවන්තලාව | අන්තෝනිඅම්මාල් (භාය්‍යාව), ජේසයියා (පුතා) |
| K. 11228—1.8.51 | ... රාමසාමි නොහොත් රෙන්ගසාමි පෙරුමාල් සීමාසහිත කොළඹ කොමාර්ෂල් සමාගම, හැටන් | රාසම්මාල් (භාය්‍යාව) |
| K. 11260—4.8.51 | ... සෙන්නප්පන් ගෝවින්ද රාජු, ඉහළ කොටස, වනරාජා වතුයාය, දික්ඔය | ජයලෙච්චිමී (භාය්‍යාව), ක්‍රිෂ්ණසාමි (පුතා), ජෙගතීසන් (පුතා), තවමනී (දුව) |
| J. 4258—18.7.51 | ... ප්‍රින්ස් නල්ලතම්බි මනී, ටිලිකෝල්ට්‍රි වත්ත, ලිඳුල ... | ඇලිස් කමලම් පත්මාවති (භාය්‍යාව), ජැනට් ඥණ බාකියම් හෙලන් (දුව) |
| J. 9866—5.8.51 | ... සින්නප්පන් වීරන්, කැස්කිබන් වත්ත, මස්කෙළිය | නල්ලම්මා නොහොත් පෙරියම්මා (දුව), සිවනු (පුතා), ආරුමුගම් (පුතා), වේළු (පුතා), පෙරුමායි (දුව), සුන්දරම නොහොත් පාර්වතී (දුව) |
| K. 11168—15.7.51 | ... පේදන් පොන්නුසාමි, බ්ලින්ක්බෝනි වත්ත, දික්ඔය | පේතායි (භාය්‍යාව), මරුදෙයි නොහොත් සන්ගපිල්ලෙයි (පුතා), රාමසාමි (පුතා), පෙරිඅක්කාල් (දුව), රාජු නොහොත් වීරන් (පුතා), සින්නයියා නොහොත් පොන්නුසාමි (පුතා), අලමේළු නොහොත් සෙල්ලම්මා (දුව), පෙරියසාමි නොහොත් අයියාවු (පුතා), පාපාති නොහොත් අන්ගම්මා (දුව) |
| K. 11837—4.8.51 | ... පෙරියන්නන් තන්ගවේල්, එරල් වත්ත, හැටන් ... | පොන්නම්මාල් (භාය්‍යාව), පෙරියසාමි (පුතා), සාමිකන්නු නොහොත් සාමිවේළු (පුතා), නාගරත්නම් (පුතා), පච්චෙයිඅම්මා (දුව), ගෝවින්දසාමි නොහොත් සින්නසාමි (පුතා), පෙරියන්නන් (පුතා), මනෝගරන් (පුතා), පූපති (දුව) |
| F. 6478/K—27.7.51 | ... එලියේසර් පාකියනාදන් ඇල්බට් ජාකොබ්, කැම්පියන් වතුයාය, බගවන්තලාව | ප්ලෝරා නවමනි (භාය්‍යාව), සැමුවෙල් (පුතා), ඩේනියල් (පුතා), ජූලියට් (දුව) |
| V. 7413/W/VFLK-31.7.51 | ... ආරුමුගම් පලනියන්ඩි, අංක 62, ප්‍රධාන මාවත, හැටන් | සිවපාකියම් (භාය්‍යාව), රාජමානික්කම් නොහොත් රාමනාදන් (පුතා), යේගම්බරම් (පුතා) |
| P. 3161—25.10.50 | ... මදළමුත්තු ජෝශප් නොහොත් අන්තෝනිමුත්තු, නැගෙනහිර ෆේසිෆර්න් කොටස, අග්‍රකන්ද වතුයාය, ලිඳුල | මදලමාරි (භාය්‍යාව), ලූසියා මේරි පතීමා (දුව), තිරේවියම් පාකියම් (දුව) |
| P. 5192—30.10.50 | ... පෙරුමාල් කවුන්දර් තාසයියා, 20, අග්‍රඌව බසාර්, අග්‍රපතන | නාගම්මාල් (භාය්‍යාව), පෙරුමාල් (පුතා), මනෝන්මනි නොහොත් සෙල්ලම්මාල් (දුව), විජයරත්නම් (පුතා) |
| P. 6302—20.2.51 | ... මුත්තුසාමි පෙරුමාල්, බැල්මෝරල් වත්ත, අග්‍රපතන | සෙල්ලම්මාල් (භාය්‍යාව), රාජේස්පරි (දුව), දනලෙච්චිමී (දුව), මුරුගන් (පුතා) |

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ප්‍රකාශනයයි

උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ ඩෙල්ෆ්ට් දූපත්හි ආදායම් නිලධාරි කොට්ඨාශයේ, සම්පූර්ණ ඩෙල්ෆ්ට් දූපතේ ගවයන් අතර "බ්ලැක් ක්වාටර්" නමැති රෝගය පැතිරී යන බැවින් රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් ආයසීදස අමරසිංහ වන මම සතුන්ගේ බෝවන රෝග සම්බන්ධ ආඥපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය සහ 1957 අංක 33 දරණ පනතේ සංශොධනය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවන රෝග ඇති ප්‍රදේශයක් ලෙස සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

උතුරට, දකුණට, නැගෙනහිරට සහ බස්නාහිරට : සම්පූර්ණ ඩෙල්ෆ්ට් දූපත.

2. මෙම ආඥපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදෙශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යනුකූලව ක්‍රියා කරන අයුරු, ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර යාපනයේ කයිට්ස් හි පශු වෛද්‍ය තැනගෙන් හෝ ඒ ඒ පළාත් කරවන ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු බව දත යුතුයි.

ආයසීදස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1958ක්වූ නොවැම්බර් මස 18 වැනි දින,
පේරාදෙණියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැනගේ
කාර්යාලයේ දීය.

---

## ප්‍රකාශනයයි

නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ ඒරාවූර් පත්තුවේ ආදයම් නිලධාරි කොට්ඨාශයේ රුගම් ගම් මුලාදැනි කොට්ඨාශයේ ගම්වල ගවයන් අතර "හෙමරෙජික් සෙප්ටිසීමියා" නමැති රෝගය පැතිරී යන බැවින් රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් ආයසීදස අමරසිංහ වන මම, සතුන්ගේ බෝවන රෝග සම්බන්ධ ආඥපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය සහ 1957 අංක 33 දරණ පනතේ සංශොධනය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව, පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවන රෝග ඇති ප්‍රදේශයක් ලෙස සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

උතුරට : පෙරිල්ලවෙලි ගම් මුලාදැනි වසම,

දකුණට : පුන්ගුඩවෙලි ගම් මුලාදැනි වසම,

නැගෙනහිරට : යුනිච්චි ගම් මුලාදැනි වසම,

බස්නාහිරට : පෙරියපුල්ලුමලෙයි ගම් මුලාදැනි වසම.

2. මෙම ආඥපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යනුකූලව ක්‍රියා කරන අයුරු, ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධ වැඩි විස්තර මඩකළපුවේ පශු වෛද්‍ය තැනගෙන් හෝ ඒ ඒ පළාත් කරවන ප්‍රාදේශීය ආදයම නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි බව මෙයින් වැඩි දුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු බව දත යුතුයි.

ආයසීදස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1958ක්වූ නොවැම්බර් මස 19 වැනි දින,
පේරාදෙණියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැනගේ
කාර්යාලයේ දීය.

---

## "කටලෙඩ සහ කුරලෙඩ" නමැති භයානක රෝගය

වයඹ පළාතේ කුරුණෑගල දඹදෙණි හත්පත්තුවේ මයුරාවති සහ නැගෙනහිර උඩුකහ කෝරළයේ කොහොලාන, පොරමඩල සහ වඩුගෙදර පළාත්වල ගවයින් අතර "කටලෙඩ සහ කුරලෙඩ" නමැති භයානක රෝගය පැතිරී යන බැව් බෝවන රෝග සම්බන්ධ ආඥපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වෙනි වගන්තියේ 1 වෙනි අතුරු වගන්තිය යටතේ බෝවන රෝග ඇති පළාත් ලෙස මා විසින් වෂී 1958ක්වූ අගෝස්තු මස 8 වෙනි දින නො. 11,471 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙන් ප්‍රසිඩ කරන ලද දැන්වීම් අද සිට අවලංගු වන බව මහජනයා වෙත දන්වමි.

ඒ. ඇල්. පෙරේරා,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහදිසාපතිතුමා.

කච්චේරිය, කුරුණෑගල.
18.11.1958.

---

## "හෙමරජික් සෙප්ටිසීමියා" නමැති භයානක රෝගය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැලඩ විල්ල හත්පත්තුවේ හේවාවිස්ස කෝරළයේ කන්දේපොල සහ හතරබාගේ පළාතේ ගවයින් අතර "හෙමරජික් සෙප්ටිසීමියා" නැමැති රෝගය පැතිරී යන බැව් බෝවන රෝග සම්බන්ධ ආඥපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වෙනි වගන්තියේ 1 වෙනි අතුරු වගන්තිය යටතේ බෝවන රෝග ඇති පළාත් ලෙස මා විසින් වෂී 1958 ක්වූ ජූලි මස 25 වෙනි දින නො. 11,436 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙන් ප්‍රසිඩ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මෙයින් මහජනයා වෙත දන්වමි.

ඒ. ඇල්. පෙරේරා,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහදිසාපතිතුමා.

කච්චේරිය, කුරුණෑගල,
19.11.58

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.